# BUSINESS FOUNDATION & ITS ENVIRONMENT (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය

ඈත අතීතයේ ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් පැවතින.

ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයේ දී තමාට අවශ්‍ය දේ තමා ම නිෂ්පාදනය කර ගන්නා ලදී.

## සෘජු නිෂ්පාදනය

තමාට අවශ්‍ය දේ තමා ම නිෂ්පාදනය කර ගැනීම සෘජු නිෂ්පාදනය ලෙස හඳුන්වයි.

## විශේෂීකරණය

සෘජු නිෂ්පාදනය තුළින් විශේෂීකරණය ඇති විය.

පුද්ගල විශේෂීකරණයේ ප්‍රතිඵලයක් ලෙස අතිරික්ත නිෂ්පාදනය ඇති විය.

ClassWork.LK

## භාණ්ඩ හුවමාරුව

අතිරික්ත නිෂ්පාදනය නිසා භාණ්ඩ හුවමාරුව සිදු විය.

ව්‍යාපාර විකාශනයේ මුල් ම අවස්ථාව භාණ්ඩ හුවමාරු ක්‍රමය වේ.

## වෙළෙඳාම

භාණ්ඩ හුවමාරුව සමඟ වෙළෙඳාම පැන නැගුණි.

## වක්‍ර නිෂ්පාදනය

වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය කිරීම වක්‍ර නිෂ්පාදනය ලෙස හඳුන්වයි.

භාණ්ඩ හුවමාරුවේ දුර්වලතා මගහරවා ගැනීමට හුවමාරු මාධ්‍ය ලෙස විවිධ ද්‍රව්‍ය භාවිත කරන ලදී.

ClassWork.LK

# භාණ්ඩ හුවමාරු ක්‍රමයේ සිට අද දක්වා මුදල් භාවිතයේ ඇති වූ ක්‍රමික විකාශනය

## ද්‍රව්‍ය භාවිතය

නිදසුන් : සිප්පිකටු, දුම්කොළ

## ලෝහ වර්ග භාවිතය

නිදසුන් : රන්, රිදී, වැනි ලෝහ වර්ග

## ලෝහ කාසි මුදල් භාවිතය

විවිධ ප්‍රමාණවලින් යුත් ලෝහ කැබලිවල මුහුණත බර, පිරිසිදු බව සහ අගයක් සඳහන් කරන ලදී. පසු කාලීන ව ඇති වූ අච්චු කාසිවලට පදනම මෙයයි.

## කාසි හා නෝට්ටු භාවිතය

වටිනා ලෝහ, මුදල් ලෙස භාවිතයට ගැනීමේ අපහසුතාවට පිළියමක් ලෙස නෛසර්ගික වටිනාකමක් නො මැති කාසි භාවිතයට ගන්නා ලදී.

ClassWork.LK

ඒ සමග ම නෝට්ටු මුදල් ද භාවිතයට ගන්නා ලදී. රජයේ බලයලත් අධිකාරිය විසින් නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු මෙයට අයත් ය.

නිදසුන් :

- ශ්‍රී ලංකාව - රුපියල්
- මහා බ්‍රිතාන්‍ය - පවුම්
- ඇමරිකා එක්සත් ජනපදය - ඩොලර්
- යූරෝපා සංගමයේ රටවල් යූරෝ

## <u>බැංකු මුදල් භාවිතය</u>

බැංකු ජංගම ගිණුම ආශ්‍රිත චෙක්පත් භාවිතය

## <u>විද්‍යුත් මුදල් භාවිතය</u>

තොරතුරු තාක්ෂණයේ හා ඩිජිටල් තාක්ෂණයේ දියුණුව සමග හඳුන්වා දුන් පරිගණක ජාලයක් මගින් ගනුදෙනු සිදුවන ක්‍රමයකි.

නිදසුන් :

- ණයපත්
- හරපත්
- පෙර ගෙවුම් කාඩ්පත්
- ක්ෂුද්‍රපත් (Microchips)/ Mobilecash

මුදල් භාවිතය ව්‍යාපාර විකාශනයේ දෙවැනි අවස්ථාව වේ.

ClassWork.LK

යුරෝපීය රටවල ඇති වූ කාර්මික ප්‍රබෝධය සමග මෙතෙක් පැවති ගෘහ කර්මාන්ත මහා පරිමාණ කර්මාන්ත බවට පත් වූ අතර ඒ සමග **වෙළෙඳාමේ ප්‍රසාරණයක්** සිදු විය.


## කාර්මික විප්ලවය

කාර්මික විප්ලවයත් සමඟ බැංකු, ප්‍රවාහනය, රක්ෂණය, සන්නිවේදනය, ගබඩාකරණය වැනි උපකාරක සේවාවල ද වර්ධනයක් සිදු විය.

කාර්මික විප්ලවය ව්‍යාපාර විකාශනයේ තුන්වන අදියර වේ.

## වාණිජ්‍යය

වෙළෙඳාම හා උපකාරක සේවාවල එකතුව වාණිජ්‍යය ලෙස හැඳින්වේ. (වාණිජ්‍යය = වෙළෙඳාම + උපකාරක සේවා)




ClassWork.LK

# විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර

වර්තමානයේ පවතින්නේ විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර පදනම් වු යුගයකි.

## විද්‍යුත් වාණිජ්‍යය

අන්තර්ජාලය හරහා මිල දී ගැනීමේ හා විකිණීමේ කටයුතු කිරීම විද්‍යුත් වාණිජ්‍යය ලෙස හැඳින්වේ.

## විද්‍යුත් ව්‍යාපාර

ව්‍යාපාරවලට අදාළ සියලු ම කාර්යයන් අන්තර්ජාලය හරහා සිදු කිරීම විද්‍යුත් ව්‍යාපාර ලෙස හැඳින්වේ.

## තොරතුරු යුගය

තොරතුරු යුගය ව්‍යාපාර විකාශනයේ හතරවන අදියර වේ.

ClassWork.LK

## විද්‍යුත් වාණිජ්‍යය වර්තමානයේ ප්‍රචලිත වීමට බලපෑ හේතු

- ලියකියවිලිවලින් තොර ව ව්‍යාපාර තොරතුරු හුවමාරු කිරීමට හැකි වීම
- ව්‍යාපාර කටයුතු වේගවත් වීම
- මෙහෙයුම් පිරිවැය, තොග පිරිවැය අඩු වීම
- ගෝලීය වූ වෙළෙඳපොළ අවකාශයක් බිහි වීම
- භාණ්ඩ හා සේවාවල ගුණාත්මකත්වය ඉහළ යාම
- ගනුදෙනුකරුවන්ගේ කාලය හා ශ්‍රමය ඉතුරු වීම
- පරිගණක සාක්ෂරතාව වැඩි වීම
- යටිතල පහසුකම්වල වර්ධනය

## ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථා

- භාණ්ඩ හුවමාරුව
- මුදල් භාවිතය
- කාර්මික විප්ලවය
- තොරතුරු ආර්ථිකය

ClassWork LK

# ව්‍යාපාර ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා

වර්තමානයේ තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදු වී ඇති ප්‍රවණතා කිහිපයක් පහත දැක්වේ.

- ගෝලීයකරණය ව්‍යාප්ත වීම
- විද්‍යුත් ව්‍යාපාර බිහි වීම
- විද්‍යුත් මුදල් භාවිතයට පැමිණීම
- පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම
- ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳ සැලකිලිමත් වීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura